සන්නස රිදී

# කට කතාවලට මං බය නැහැ



**'උදාරි වර්ණකුලසූරිය'** ජාත්‍යන්තර රූ රැජින තරගාවලියක එක් තරග අංශයක් ජය ගත්තා. ඒ 'Mrs. Global' තරගාවලියේ 'Celebrate of the year' කියන තරග අංශයේ කිරුළයි.

***හැම තරගකරුවකුගෙම බලාපොරොත්තුව ජයග්‍රහනය, මගෙත් හිතේ ඒ හීනෙ තිබුනා. රටවල් 62ක් අතරින් මට ජයග්‍රහණය හිමිවුන අංශය මට වටිනවා.***



**මේ තරගාවලියේ උණුසුමත් එක්කම ඔයා ඩිවෝස් වෙන්න යනවා කියලා කතාවකුත් පැතිරුණා?**

ඔය වගේ තේරුමක් නැති කතා කියන්නේ, කතා හදන්නේ කවුද කියලා මං දන්නේ නැහැ. ඒත් මම ඔය එක කතාවක්වත් ගණන් ගන්නේ නැහැ.

**මේ කට කතා නිසා සැමියා අපහසුතාවට පත්වෙන්නෙ නැද්ද?**

ඔහු උගත්, බුද්ධිමත් පුද්ගලයෙක්. ඔය කතා අහලා අපේ පවුලෙ ගැටුම් ඇති කරගන්න තරම් පටු මානසිකත්වයක ඔහු නැහැ. අපි අපිව හොඳින් තේරුම් අරගෙන ඉන්නේ. කාගෙවත් කතාවලට අපේ බැඳීම් නැතිකර ගන්න තරම් දුර්වල මානසිකත්වයක් අපට නැහැ.

**දැන් රූ රැජින තරගාවලිය අවසන්වෙලා, රංගනකටයුතු පටන් ගත්තද?**

නැහැ. මම අලුත් අවුරුද්ද ලබන කොට මහත්තයා ළඟ ඉන්න ඕන.ඊට පස්සේ ඇවිත් රංගන කටයුතු පටන් ගන්නවා. මම කොහොමත් එක දිගට රංගන කටයුතු වල යෙදුන කෙනෙක් නෙවෙයි. වසර දෙකක් රඟපාලා තව වසරක් විතර නිහඬව ඉඳලා ආයෙමත් රඟපාන්න එද්දි මට හොඳ රසික ප්‍රතිචාර ලැබෙනවා. තවමත් මම රසිකයන්ට එපා නොවුන නිළියක් වෙලා තියෙන්නෙ ඒකයි.

බුද්ධිනී ජයවර්ධන

## ප්‍රියංකා යළි බොලිවුඩයට



අන්තර්ජාතික TV සීරීස් එකක් වන Uanticoy රඟපෑමෙන් අනතුරුව ප්‍රියංකා චොප්රා ලොස් ඇන්ජලීස්හි සිට නැවතත් මුම්බායි බලා ආවා. ඒත් මේ ආවේ මුම්බායිවලින් යන්න පෙර සිටි ප්‍රියංකාමද්දැයි බොහෝ දෙනෙක් කුතුහලයෙන් බලාගෙන සිටියේ සළු පාට ඇඳුමකින් සැරසී සිටි ප්‍රියංකාගේ ආදරණීය හිනාව දැකීමෙන් පසුවයි. ඒ වගේම ප්‍රියංකා ඇමරිකාවේ සිටින කාලය අතරතුර ඇගේ පෙම් සබඳතාවක් ගැන ආරංචි වුනා. කොහොම වුණත් තමන්ගේ නැවත පැමිණීම පිළිබඳව ප්‍රියංකා ට්විටර් පණිවුඩයක් ද යවා තිබුණා. ඒ ආපහු ගෙදර ආපු එක හරිම ආදරණීය හැඟීමක් එක් කළ බවටයි.

## ජැක්ලින්ගෙන් ආක්ෂේට නත්තල් තෑග්ගක්



මේ නත්තල් සමය නිසා හිනම වෙලාවක සැඟවුණු සැන්ටලා එන්න පුළුවන්. බොලිවුඩය පැත්තෙනුත් සැඟවුණු සැන්ටෙක් ගැන ආරංචි වුණා. හැබැයි මෙයා ඇවිත් තියෙන්නෙ House Full චිත්‍රපටයේ රූගත කිරීම් අතරතුර ශූ. ඒ වෙන කවුරුත් නෙමෙයි ජැක්ලින් ෆර්ඩිනැන්ඩස්. ජැක්ලීන් එක්වරම ආක්ෂේ කුමාර්ට දෙන තෑග්ගක් නිසා පුදුමවෙලා එය අතට ගන්න ආක්ෂේ ඒ පුංචි පෙට්ටියේ මුකුත්ම නැති බව දැනගන්නවා. ඒ වෙලාවේ ආක්ශේ ළඟ තිබුණු කාඩ්බෝඩ් එකකින් ජැක්ලීන්ට දෙක තුනක් ගහනවා. කොහොමවුණත් මේ අලුත් සැන්ටී ගැන ආක්ෂේට නම් සතුටු නෑ වගේ.

## ෆාවඩ් නිසා ෂූටිං නතර වෙයි



Ae Dil Hai Mushkil චිත්‍රපටයේ රූගත කිරීම් අතරතුර ෆාවඩ් ඛාන් හදිසියේ රෝගී වීම නිසා රූගත කිරීම් අතරතුර නතර කරන්නට සිදුවුණා. චිත්‍රපටයේ රූගත කිරීම් සඳහා සහභාගී වී සිටිය රන්බීර් කපූර් හා අනුෂ්කා ෂර්මා ඇතුළු පිරිස ෆාවඩ්ව රෝහල් ගත කිරීමට ද කටයුතු කර තිබුණා. ෆාවඩ්ගේ අසනීප තත්ත්වය හේතුවෙන් ඔහු එක් වීමට නියමිතව තිබූ රූගත කිරීම් කිහිපයක්ම නතර කරන්නට සිදුව තිබුණා. මේ සියල්ල අතරේ ෆාවඩ්ගේ උපන් දිනය ද යෙදී තිබුණා. ඔහුගේ උපන් දිනය සමරන්න ඔහුගේ බිරිඳ සදාෆ් කටයුතු කළා වගේම ෆාවඩ්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කර තිබුණා.